tamilguru.lk



**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරි සේවයේ III ශ්‍රේණියේ නිලධාරින් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026

**01.** ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරි සේවයේ III ශ්‍රේණියේ නිලධාරින් සඳහා අදාළ අනුමත සේවා ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුකූලව කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් **2026 අප්‍රේල් මාසයේ දී** පවත්වනු ලබනු බවත් ඒ සඳහා අයදුම්පත් කැඳවන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ අපගේ සේවාවන් (Our services) යටතේ Online Applications (Recruitment/ E.B.Exams) මුහුණත මගින් පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (Online) ක්‍රමයට පමණි. පළමු වන වරට විභාගයට පෙනී සිටින නිලධාරින් හා ඉන්පසු වාරවල දී ඉදිරිපත්වන නිලධාරින් තමා පෙනී සිටින වාරය නිවැරදිව තෝරා ගත යුතුය. අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතේ වෙනත් තොරතුරු අයදුම්කරුගේ සහතිකය, අත්සන සහතික කිරීම හා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය යන කොටස් සම්පූර්ණ කර අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊට පෙර "විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ" වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ වම් පස ඉහළ කෙළවරේ ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරි සේවයේ III ශ්‍රේණියේ නිලධාරින් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026 යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. අයදුම්පත භාර ගන්නා අවසාන දිනය **2026 පෙබරවාරි මස 16 දින වේ.**

*සටහන* **- අයදුම්පතේ මුද්‍රිත පිටපත තැපැල් මගින් එවීම අනිවාර්ය අතර එය තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදු විය හැකි පාඩුව අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතු ය. (බාගත කර ගන්නා අයදුම්පතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)**

**02.** මෙම විභාගය ග්‍රාම නිලධාරි III ශ්‍රේණියේ නිලධාරින් සඳහා පහත සඳහන් වගු අංක 01 හි සඳහන් නගරවල දී පමණක් පැවැත්වේ. එම නගරවලට අදාළ නගර අංක පහත වගුවේ දැක්වෙන අතර අයදුම්පතේ අදාළ ශීර්ෂය මෙම නගර හා නගර අංක සඳහන් වගුව අනුව සම්පූර්ණ කළ යුතු වේ. ඉල්ලුම් කළ නගරය/ නගර පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. ඉහත සඳහන් යම්කිසි මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අපේක්ෂකයන් සංඛ්‍යාවක් නොමැති වුවහොත් එම මධ්‍යස්ථානය අවලංගු කර ඊට ආසන්න මධ්‍යස්ථානයක් වෙත අදාළ අයදුම්කරුවන් යොමු කෙරෙනු ඇත.

තව ද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් විභාගය **කොළඹ දී** පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් කටයුතු කරනු ඇත.

**වගු අංක 01 : විභාගය පැවැත්වෙන නගර හා නගර අංක**

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 02 |
| ගාල්ල | 03 |
| යාපනය | 04 |
| මඩකලපුව | 05 |
| කුරුණෑගල | 06 |
| අනුරාධපුර | 07 |
| බදුල්ල | 08 |
| රත්නපුර | 09 |

**03.** (i) මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ.

(ii) විභාග අපේක්ෂකයන් සඳහා පනවා ඇති නීති *ගැසට්* නිවේදනයේ මුල වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

**04.** සුදුසුකම් - මේ වනවිට ග්‍රාම නිලධාරි III ශ්‍රේණියේ සිටින නිලධාරින් මෙම විභාගය සඳහා ඉදිරිපත් වීමට සුදුසුකම් ලබයි.

**05.** විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කරගත හැකි පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ ගෙන නොමැති බව තහවුරු කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

**06.** **(i)** අයදුම්පත් - මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව කරන ලද මෘදු පිටපත හා ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලද මුද්‍රිත පිටපත (printout) යන දෙකම විභාග දෙපාර්තමේන්තුවට ලැබුණු පසු එම මෘදු පිටපත හා මුද්‍රිත පිටපත සත්‍යාපනය කිරීම (verify) සිදු කරනු ලබන අතර, වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (ඊ-මේල්) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කරගන්න. අයදුම්පත පිරවීමේදී මෙම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව, එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් - අයදුම්පත පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

(iii) පළමුවන වරට මෙම විභාගයට අයදුම්කරන නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතෙකුදු වුවත් ඉන් පසු වාරවල දී නිලධාරින් විසින් එක් විෂයයකට රු. 250/- බැගින් ගෙවිය යුතු වේ. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම් සිදු කළ යුතු ය.

i. බැංකු ණය කාඩ් පත් මගින් (Bank Credit Card)

ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම් සක්‍රිය කර ඇති ඕනෑම හර කාඩ්පතක් මගින් (Bank Debit Card with Internet Bank Facility)

iii. ලංකා බැංකු ඔන්ලයින් බැන්කින් ක්‍රමය (Bank of Ceylon Online Banking Method)

iv. ලංකා බැංකු ශාඛාවක් මගින් (Bank of Ceylon Slip Payment)

*සටහන* - ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදු වන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු/වෙනත් විභාගයක් සඳහා මාරු කරනු නොලැබේ.

07. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව සඳහන් කරමින් වෙබ් නිවේදනයක් මඟින්/ අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. නිවේදනය පළවී දින 02ක් හෝ 03ක් ගතවූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා

පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත / විභාග ගාස්තු ගෙවීම අදාළනම් ඊට අදාළ ලදුපතෙහි ඡායා පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදානමින් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශපත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතු ය. විභාග ශාලාවේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

*සටහන* - අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

**08.** විභාග ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කර තිබිය යුතුය. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු ය.

**09.** විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබාදිය යුතු ය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

**10.** සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍යවලින් පමණක් මෙම විභාගය පැවැත්වෙන අතර අදාළ සේවයට ඇතුළත් වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටීමට නිලධාරීන්ට පුළුවන. තරග විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධාරීන්ට ද තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටිය හැකිය. විභාගය සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

**11.** තමන් කැමැති නම් එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාරවල දී පෙනී සිටීමට නිලධාරීන්ට හැකිවේ. එතෙකුදු වුවත් සාමර්ථය සඳහා එක් එක් විෂයයට නියමිත මුළු ලකුණුවලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) බැගින්වත් ලබාගත යුතු වේ. සියලු විෂයයන් සමත් වී විභාගය සම්පූර්ණ කරනු ලබන වර්ෂයේ විභාගය පවත්වන ලද අවසාන දිනය මෙම කාර්යක්ෂමතා කඩ ඉම සමත් වූ දිනය ලෙස සලකනු ලැබේ.

**12.** විභාග ප්‍රතිඵල විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් මා වෙත නිකුත් කරන අතර, විභාගය සමත් වූ අපේක්ෂකයන්ගේ නම් දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් මඟින් අයදුම්කරුවන්ට දැන්වීමට කටයුතු කරනු ඇත.

**13.** විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවන අතර, මෙම විභාග නිවේදනය මඟින් විධිවිධාන සලසා නොමැති මෙම විෂයයට අදාළ කවර කරුණක් පිළිබඳ වුව ද මාගේ තීරණය අවසාන තීරණය වන්නේය.

**14.** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**15.** විභාග පටිපාටිය : අපේක්ෂකයන් පහත දැක්වෙන විෂයන් ඇතුළත් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය.

වගු අංක 02 : විභාගය පැවැත්වෙන විෂයන් සහ අදාළ වන අනෙකුත් විස්තර

| | *විෂයය* | *විෂයය අංකය* | *ලකුණු* | *කාලය* |
|---|---|---|---|---|
| 01 | කාර්යාල ක්‍රම හා ගිණුම් | 01 | 100 | පැය 02 |
| 02 | විෂයානුබද්ධ වෘත්තීය දැනුම | 02 | 100 | පැය 02 |
| 03 | පරිගණක පරීක්ෂණය ලිඛිත පරීක්ෂණය | 03 | 100 | පැය 01 ½ |

**15.1 කාර්යාල ක්‍රම හා ගිණුම් (විෂය අංකය - 01)**

<u>(අ) කාර්යාල ක්‍රම</u>

ග්‍රාම නිලධාරි කාර්යාලයේ හා රජයේ කාර්යාලවල භාවිතවන කාර්යාල ක්‍රම පිළිබඳව මූලික දැනුම ප්‍රායෝගිකව භාවිත කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම හා රාජකාරි ලිපි ලේඛන මැනවින් අවබෝධ කොට ගෙන පැහැදිලි හා සංක්ෂිප්ත සටහන් මඟින් තම අදහස් / නිරීක්ෂණ නිශ්චිත අන්දමින් ඉදිරිපත් කිරීමේ හැකියාව සහ විෂයානුබද්ධ කරුණු සම්බන්ධව වාර්තාවක් කෙටුම්පත් කිරීමේ හැකියාව ද පරීක්ෂා කෙරේ.

<u>(ආ) ගිණුම්</u>

ග්‍රාම නිලධාරි වෙත පැවරී ඇති රාජකාරිවලට අදාළ හා රජයේ කාර්යාලවල භාවිතවන මූලික ගිණුම් හා ගිණුම් ක්‍රම ද මුදල් පාලන පොත්වල කාර්යන්, ප්‍රසම්පාදන පිළිබඳව ද අවබෝධය හා දැනුම මැනීම අපේක්ෂා කෙරේ.

15.1.1 ප්‍රශ්න පත්‍රය පිළිබඳ විස්තර

I කොටස - කෙටි පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවලින් යුක්තය. ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සැපයිය යුතු ය. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ය. (ලකුණු 25)

II කොටස - ප්‍රශ්න තුනකින් සමන්විත ව්‍යුහගත රචනාමය ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න තුනට ම පිළිතුරු සැපයිය යුතු ය. (ලකුණු 75යි)

**15.2 විෂයානුබද්ධ වෘත්තීය දැනුම (විෂය අංකය - 02)**

ග්‍රාම නිලධාරින්ට අදාළ විවිධ අණපනත් හා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා වෙනත් රජයේ ව්‍යාවස්ථාපිත ආයතන මඟින් පැවරී ඇති රාජකාරී පිළිබඳ දැනුම පරීක්ෂා කෙරේ.

15.2.1 ප්‍රශ්න පත්‍රය පිළිබඳ විස්තර

I කොටස - කෙටි පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවලින් යුක්තය. ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සැපයිය යුතු ය. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ය. (ලකුණු 25)

II කොටස - ප්‍රශ්න තුනකින් සමන්විත ව්‍යුහගත රචනාමය ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න තුනටම පිළිතුරු සැපයිය යුතු ය. (ලකුණු 75යි)

**15.3 පරිගණක පරීක්ෂණය (විෂය අංක - 03)**

අයදුම්කරුට පහත සඳහන් හැකියාවන් තිබේදැයි පරීක්ෂා කිරීම මෙම පරීක්ෂණයේ අරමුණ වේ.

I. තොරතුරු තාක්ෂණය පිළිබඳ මූලික සංකල්ප

II. මෙහෙයුම් පද්ධති

III. ගොනු කළමනාකරණය

IV. වදන් සැකසුම
- i. මූලික කුසලතා, තිරයට හුරුවීම, පාඨ සංස්කරණය, පාඨ එකේලි කිරීම, අකුරු වර්ග හා උප ලක්ෂණ, අනුඡේද, ඡේද, පේළි අතර පරතරය වෙනස් කිරීම, පිමි අනුයෝගය (Tab Settings), පාඨයක් සෙවීම හා ප්‍රතිෂ්ඨාපනය,
- ii. අක්ෂර හා ව්‍යාකරණ දෝෂ, සමානාර්ථ පද,
- iii. තීරු යෙදීම, පිටුව සැකසීම,
- iv. ලේඛන මුද්‍රණය, වගු නිර්මාණය, අනුපිළිවෙළට සැකසීම,
- v. ගොනු කළමනාකරණය,
- vi. ලේඛනයක් ලිපිනයන් කිහිපයකට යැවීමට සැකසීම,
- vii. මැක්‍රෝ භාවිතය,

V. පැතුරුම් පත්
- i. මූලික කුසලතා,
- ii. ආකෘතිකරණය ( Formatting ),
- iii. සංස්කරණය,
- iv. තීරු හා පරාස, නව ඇතුළත් කිරීම් හා ඉවත් කිරීම්,
- v. දත්ත අනුපිළිවෙළට සැකසීම,
- vi. ප්‍රස්තාර සැකසීම,
- vii. මුද්‍රණය,
- viii. @ ශ්‍රිත (@ Functions)
- ix. මැක්‍රෝ භාවිතය, ගොනු කළමනාකරණය,

| | | | |
|---|---|---|---|
| VI. | දත්ත සමුදාය | i. | හැඳින්වීම, මූලික කුසලතා, |
| | | ii. | දත්ත සමුදාය නිර්මාණය හා භාවිතය, |
| | | iii. | ආකෘති, |
| | | iv. | සන්ධානගත ආකෘති, උත්පතන ආකෘති (popup forms), |
| | | v. | විමසුම් (queries), |
| | | vi. | අනුපිළිවෙළට සැකසීම, |
| | | vii. | වාර්තා ලබා ගැනීම, |
| | | viii. | මැක්‍රෝ භාවිතය, |
| VII. | ඉදිරිපත් කිරීම් / චිත්‍ර සටහන් | i. | මූලික කුසලතා, සංස්කරණය, ආකෘතිකරණය, |
| | | ii. | සැලසුම් යෙදීම, |
| | | iii. | අනුරූප, පසුරු සිත්තම් හා ප්‍රස්තාර නිවේශනය, |
| | | iv. | කදා මාරුව හා සජීවකරණය, ඉදිරිපත් කිරීමේ මෙවලම් භාවිතය, |
| | | v. | ගුරු (Master) කදාව සැකසීම, |
| | | vi. | කදා මුද්‍රණය හා සටහන්, |
| VIII. | අන්තර්ජාලය | i. | අන්තර්ජාලය හැඳින්වීම, විශ්ව විසිරි ජාලය, |
| | | ii. | මං සොයන ආකාරය, |
| | | iii. | ව්‍යවහාරික අන්තර්ජාලය |
| IX. | විද්‍යුත් තැපැල (E-Mail) | i. | හැඳින්වීම, මූලික කුසලතා, විද්‍යුත් තැපැල ලබා ගැනීම, |
| | | ii. | විද්‍යුත් තැපැල යැවීම හා ඊට ප්‍රතිචාර දැක්වීම. |
| | | iii. | ඇමුණුම් භාවිතය, ලිපිනය හඳුනා ගැනීමට කෙටි නාම භාවිතය, |
| | | iv. | පණිවුඩ සම්පාදනය, |

15.3.1 ප්‍රශ්න පත්‍රය පිළිබඳ විස්තර

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත වන අතර පහත සඳහන් I හා II යන කොටස් දෙකට ම නියමිත කාලය පැය 1 ½කි.

| | | |
|---|---|---|
| I කොටස | - | බහුවරණ/ කෙටි පිළිතුරු ප්‍රශ්න 40 කින් යුක්ත වේ. (ලකුණු 40 යි) |
| II කොටස | - | අර්ධ ව්‍යුහගත ප්‍රශ්න 05 කි. (ලකුණු 60 යි) |

**15.3.2 පරිගණක විෂයෙහි ලිඛිත පරීක්ෂණයෙන් නිදහස් වීම සඳහා අවශ්‍ය සුදුසුකම්**

(අ) පරිගණක විෂයෙහි ලිඛිත පරීක්ෂණයෙන් නිදහස් වීමට සුදුසුකම් ලබන පාඨමාලා හා සහතික පත්‍ර

2024.06.06 දිනැතිව අනුමත ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරි සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පරිශිෂ්ට 02 හි 06 ඡේදයට අනුව ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන පරිගණක මෙහෙයුම් බලපත්‍රය හෝ පරිගණක මෙහෙයුම් බලපත්‍රයට සමාන හෝ ඊට ඉහළ ගුණාත්මක අගයක් ඇති, තෘතියික අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ආයතනවලින් නිකුත් කරන ලද පරිගණක පිළිබඳ සහතික පත්‍ර ලබා ඇති නිලධරයන් මෙම පරිගණක හැකියාව විමසන ලිඛිත පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබේ. තව ද ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන පරිගණක යෙදවුම් සහායක (NVQ මට්ටම 3) සහතිකය ලබා ඇති නිලධරයන් මෙම පරිගණක හැකියාව විමසන ලිඛිත පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබේ.

(ආ) පරිගණක විෂයෙහි ලිඛිත පරීක්ෂණයෙන් නිදහස් වීමට සුදුසුකම් ලබන උපාධි පාඨමාලා

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පහත සඳහන් උපාධියක් ලබා ඇති නිලධාරින් ග්‍රාම නිලධාරි පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙහි පරිගණක පරීක්ෂණයෙන් නිදහස් කිරීමට කටයුතු කරනු ලැබේ.

1) පරිගණක විද්‍යා/ තොරතුරු තාක්ෂණ උපාධියක් ;

*හෝ*

2) පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති උපාධියක්.

**එස්. ආලෝකබණ්ඩාර,**
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත්
පාලන අමාත්‍යාංශය.

2026 ජනවාරි මස 06 දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය,
නිල මැදුර, ඇල්විටිගල මාවත,
කොළඹ 05.

**උපලේඛනය - I**

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය* | *අයත් දිස්ත්‍රික්කය හා අංකය* | *අයත් පළාත හා අංකය* |
|---|---|---|---|
| කොළඹ | 1103 | 01 කොළඹ | 01 බස්නාහිර පළාත |
| කොලොන්නාව | 1106 | | |
| කඩුවෙල | 1109 | | |
| හෝමාගම | 1112 | | |
| සීතාවක(හංවැල්ල) | 1115 | | |
| පාදුක්ක | 1118 | | |
| මහරගම | 1121 | | |
| ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ | 1124 | | |
| තිඹිරිගස්යාය | 1127 | | |
| දෙහිවල | 1130 | | |
| රත්මලාන | 1131 | | |
| මොරටුව | 1133 | | |
| කැස්බෑව | 1136 | | |
| | | | |
| මීගමුව | 1203 | 02 ගම්පහ | |
| කටාන | 1206 | | |
| දිවුලපිටිය | 1209 | | |
| මීරිගම | 1212 | | |
| මිනුවන්ගොඩ | 1215 | | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය | අයත් පළාත හා අංකය |
|---|---|---|---|
| වත්තල | 1218 | 02 ගම්පහ | 01 බස්නාහිර පළාත |
| ජා ඇල | 1221 | | |
| ගම්පහ | 1224 | | |
| අත්තනගල්ල | 1227 | | |
| දොම්පේ | 1230 | | |
| මහර | 1233 | | |
| කැලණිය | 1236 | | |
| බියගම | 1239 | | |
| | | | |
| පානදුර | 1303 | 03 කළුතර | |
| බණ්ඩාරගම | 1306 | | |
| හොරණ | 1309 | | |
| ඉංගිරිය | 1310 | | |
| බුලත්සිංහල | 1312 | | |
| මදුරාවල | 1315 | | |
| මිල්ලනිය | 1318 | | |
| කළුතර | 1321 | | |
| බේරුවල | 1324 | | |
| දොඩන්ගොඩ | 1327 | | |
| මතුගම | 1330 | | |
| අගලවත්ත | 1333 | | |
| පාලින්දනුවර | 1336 | | |
| වලල්ලාවිට | 1339 | | |
| | | | |
| තුම්පනේ | 2103 | 04 මහනුවර | 02 මධ්‍යම පළාත |
| පූජාපිටිය | 2106 | | |
| අකුරණ | 2109 | | |
| පාතදුම්බර | 2112 | | |
| පන්විල | 2115 | | |
| උඩුදුම්බර | 2118 | | |
| මිනිපේ | 2121 | | |
| මැදදුම්බර | 2124 | | |
| කුණ්ඩසාලේ | 2127 | | |
| ගඟවට කෝරළේ | 2130 | | |
| හාරිස්පත්තුව | 2133 | | |
| හතරලියද්ද | 2134 | | |
| යටිනුවර | 2136 | | |
| උඩුනුවර | 2139 | | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය | අයත් පළාත හා අංකය |
|---|---|---|---|
| දොළුව | 2142 | 04 මහනුවර | 02 මධ්‍යම පළාත |
| පාතහේවාහැට | 2145 | | |
| දෙල්තොට | 2148 | | |
| උඩපළාත | 2151 | | |
| ගඟඉහළ කෝරළේ | 2154 | | |
| පස්බාගෙ කෝරළේ | 2157 | | |
| | | | |
| ගලේවෙල | 2203 | 05 මාතලේ | |
| දඹුල්ල | 2206 | | |
| නාඋල | 2209 | | |
| පල්ලේපොල | 2212 | | |
| යටවත්ත | 2215 | | |
| මාතලේ | 2218 | | |
| අඹන්ගඟ කෝරළේ | 2221 | | |
| ලග්ගල පල්ලේගම | 2224 | | |
| විල්ගමුව | 2227 | | |
| රත්තොට | 2230 | | |
| උකුවෙල | 2233 | | |
| | | | |
| කොත්මලේ | 2303 | 06 නුවරඑළිය | |
| කොත්මලේ බටහිර | 2304 | | |
| හඟුරන්කෙත | 2306 | | |
| මතුරට | 2307 | | |
| වලපනේ | 2309 | | |
| නිල්දණ්ඩාහින්න | 2310 | | |
| නුවරඑළිය | 2312 | | |
| තලවකැලේ | 2313 | | |
| අඹගමුව | 2315 | | |
| නෝර්වුඩ් | 2316 | | |
| | | | |
| බෙන්තොට | 3103 | 07 ගාල්ල | 03 දකුණු පළාත |
| බලපිටිය | 3106 | | |
| කරන්දෙණිය | 3109 | | |
| ඇල්පිටිය | 3112 | | |
| නියාගම | 3115 | | |
| තවලම | 3118 | | |
| නෙළුව | 3121 | | |
| නාගොඩ | 3124 | | |
| බද්දේගම | 3127 | | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය | අයත් පළාත හා අංකය |
|---|---|---|---|
| වඳුරඹ | 3128 | 07 ගාල්ල | 03 දකුණු පළාත |
| වැලිවිටිය දිවිතුර | 3130 | | |
| අම්බලන්ගොඩ | 3133 | | |
| හික්කඩුව | 3136 | | |
| රත්ගම | 3137 | | |
| මාදම්පාගම | 3138 | | |
| කඩවත්සතර | 3139 | | |
| බෝපෙ පෝද්දල | 3142 | | |
| අක්මීමන | 3145 | | |
| යක්කලමුල්ල | 3148 | | |
| ඉමදූව | 3151 | | |
| හබරාදූව | 3154 | | |
| ගෝනපීනුවල | 3157 | | |
| | | | |
| පිටබැද්දර | 3203 | 08 මාතර | |
| කොටපොල | 3206 | | |
| පස්ගොඩ | 3209 | | |
| මුලටියන | 3212 | | |
| අතුරලිය | 3215 | | |
| අකුරැස්ස | 3218 | | |
| වැලිපිටිය | 3221 | | |
| මාලිම්බඩ | 3224 | | |
| කඹුරුපිටිය | 3227 | | |
| හක්මන | 3230 | | |
| කිරින්ද පුහුල්වැල්ල | 3233 | | |
| තිහගොඩ | 3236 | | |
| වැලිගම | 3239 | | |
| මාතර | 3242 | | |
| දෙවිනුවර | 3245 | | |
| දික්වැල්ල | 3248 | | |
| | | | |
| සූරියවැව | 3303 | 09 හම්බන්තොට | |
| ලුණුගම්වෙහෙර | 3306 | | |
| තිස්සමහාරාමය | 3309 | | |
| හම්බන්තොට | 3312 | | |
| අම්බලන්තොට | 3315 | | |
| අඟුණකොළපැලැස්ස | 3318 | | |
| වීරකැටිය | 3321 | | |
| කටුවන | 3324 | | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය | අයත් පළාත හා අංකය |
|---|---|---|---|
| ඕකේවෙල | 3327 | 09 හම්බන්තොට | 03 දකුණු පළාත |
| බෙලිඅත්ත | 3330 | | |
| තංගල්ල | 3333 | | |
| වලස්මුල්ල | 3336 | | |
| | | | |
| කයිට්ස් | 4103 | 10 යාපනය | 04 උතුරු පළාත |
| වානක්කනි | 4106 | | |
| සන්දිලිපායි | 4109 | | |
| තෙලිප්පායි | 4112 | | |
| උඩුවිල් | 4115 | | |
| කෝපායි | 4118 | | |
| කරවෙඩ්ඩි | 4121 | | |
| මුරුතන්කර්නි | 4124 | | |
| පොයින්ට් පේද්‍රු | 4127 | | |
| චාවාකච්චේරි | 4130 | | |
| නල්ලූර් | 4133 | | |
| යාපනය | 4136 | | |
| වෙලනායි | 4139 | | |
| ඩෙල්ෆ් | 4142 | | |
| කරෙයිනගර් | 4145 | | |
| | | | |
| මන්නාරම | 4203 | 11 මන්නාරම | |
| මාන්තායි බටහිර | 4206 | | |
| මඩු | 4209 | | |
| නානද්දාන් | 4212 | | |
| මුසාලි | 4215 | | |
| | | | |
| වවුනියා උතුර | 4303 | 12 වවුනියා | |
| වවුනියා දකුණ | 4306 | | |
| වවුනියා | 4309 | | |
| වෙන්ගලචේඩිකුලම් | 4312 | | |
| | | | |
| තුනුක්කායි | 4403 | 13 මුලතිව් | |
| මාන්තායි නැගෙනහිර | 4406 | | |
| පුදුකුඩිඉරුප්පු | 4409 | | |
| ඔඩ්ඩුසුඩාන් | 4412 | | |
| මැරිටයිම්පත්තු | 4415 | | |
| වැලිඔය | 4418 | | |
| | | | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය | අයත් පළාත හා අංකය |
|---|---|---|---|
| පච්චිලෙයිපල්ලි | 4503 | 14 කිලිනොච්චිය | 04 උතුරු පළාත |
| කඳවලෙයි | 4506 | | |
| කරච්චි | 4509 | | |
| පූනාකරි | 4512 | | |
| | | | |
| කෝරළේපත්තු උතුර | 5103 | 15 මඩකලපුව | 05 නැගෙනහිර පළාත |
| කෝරළේපත්තු බටහිර | 5106 | | |
| කෝරළේපත්තු | 5109 | | |
| එරාවූර්පත්තු | 5112 | | |
| එරාවූර් නගරය | 5115 | | |
| මන්මුනේ උතුර | 5118 | | |
| මන්මුනේ බටහිර | 5121 | | |
| කාත්තන්කුඩි | 5124 | | |
| මන්මුනේපත්තු | 5127 | | |
| මන්මුනේ නිරිත | 5130 | | |
| පෝර්තිව්පත්තු | 5133 | | |
| මන්මුනේ දකුණ | 5136 | | |
| කෝරළේපත්තු දකුණ | 5139 | | |
| කෝරළේපත්තු මධ්‍යම | 5142 | | |
| | | | |
| දෙහිඅත්තකණ්ඩිය | 5203 | 16 අම්පාර | |
| පදියතලාව | 5206 | | |
| මහඔය | 5209 | | |
| උහන | 5212 | | |
| අම්පාර | 5215 | | |
| නාවින්දවේලි | 5216 | | |
| සමන්තුරෙයි | 5218 | | |
| කල්මුණේ | 5224 | | |
| සයින්ද මුරුදූ | 5225 | | |
| කාර්තිවු | 5227 | | |
| නින්දවූර් | 5230 | | |
| අඩ්ඩාලච්චේන | 5233 | | |
| ඉරක්කාමම් | 5234 | | |
| අක්කරපත්තුව | 5236 | | |
| අලයඩිවෙම්බු | 5239 | | |
| දමන | 5242 | | |
| තිරුක්කෝවිල් | 5245 | | |
| පොතුවිල් | 5248 | | |
| ලාහුගල | 5251 | | |
| කල්මුණ උතුර උප | 5254 | | |
| | | | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය | අයත් පළාත හා අංකය |
|---|---|---|---|
| පදවි ශ්‍රී පුර | 5303 | 17 ත්‍රිකුණාමලය | 05 නැගෙනහිර පළාත |
| කුච්චවේලි | 5306 | | |
| ගෝමරන්කඩවල | 5309 | | |
| මොරවැව | 5312 | | |
| නගර හා කඩවත් | 5315 | | |
| තඹලගමුව | 5318 | | |
| කන්තලේ | 5321 | | |
| කින්නියා | 5324 | | |
| මුතූර් | 5327 | | |
| සේරුවිල | 5330 | | |
| වෙරුගල් /ඉච්චලම්පත්තු | 5333 | | |
| | | | |
| ගිරිබාව | 6103 | 18 කුරුණෑගල | 06 වයඹ පළාත |
| ගල්ගමුව | 6106 | | |
| ඇහැටුවැව | 6109 | | |
| අඹන්පොල | 6112 | | |
| කොටවෙහෙර | 6115 | | |
| රස්නායකපුර | 6118 | | |
| නිකවැරටිය | 6121 | | |
| මහව | 6124 | | |
| පොල්පිතිගම | 6127 | | |
| ඉබ්බාගමුව | 6130 | | |
| ගනේවත්ත | 6133 | | |
| වාරියපොල | 6136 | | |
| කොබෙයිගනේ | 6139 | | |
| බිංගිරිය | 6142 | | |
| බමුණාකොටුව | 6149 | | |
| මාස්පොත | 6151 | | |
| කුරුණෑගල | 6154 | | |
| මල්ලවපිටිය | 6157 | | |
| මාවතගම | 6160 | | |
| රිදීගම | 6163 | | |
| වීරඹුගෙදර | 6166 | | |
| කුලියාපිටිය නැගෙනහිර | 6169 | | |
| කුලියාපිටිය බටහිර | 6172 | | |
| උඩුබද්දාව | 6175 | | |
| පන්නල | 6178 | | |
| නාරම්මල | 6181 | | |
| අලව්ව | 6184 | | |

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය* | *අයත් දිස්ත්‍රික්කය හා අංකය* | *අයත් පළාත හා අංකය* |
|---|---|---|---|
| පොල්ගහවෙල | 6187 | 18 කුරුණෑගල | 06 වයඹ පළාත |
| පඩුවස්නුවර නැගෙනහිර | 6190 | | |
| පඩුවස්නුවර බටහිර | 6193 | | |
| | | | |
| කල්පිටිය | 6203 | 19 පුත්තලම | |
| වනාතවිල්ලුව | 6206 | | |
| කරුවලගස්වැව | 6209 | | |
| නවගත්තේගම | 6212 | | |
| පුත්තලම | 6215 | | |
| මුන්දලම | 6218 | | |
| මහකුඹුක්කඩවල | 6221 | | |
| ආණමඩුව | 6224 | | |
| පල්ලම | 6227 | | |
| ආරච්චිකට්ටුව | 6230 | | |
| හලාවත | 6233 | | |
| මාදම්පෙ | 6236 | | |
| මහවැව | 6239 | | |
| නාත්තන්ඩිය | 6242 | | |
| වෙන්නප්පුව | 6245 | | |
| දංකොටුව | 6248 | | |
| | | | |
| පදවිය | 7103 | 20 අනුරාධපුරය | 07 උතුරු මැද පළාත |
| කැබිතිගොල්ලෑව | 7106 | | |
| මැදවච්චිය | 7109 | | |
| මහවිලච්චිය | 7112 | | |
| මධ්‍යම නුවරගම්පලාත | 7115 | | |
| රඹෑව | 7118 | | |
| කහටගස්දිගිලිය | 7121 | | |
| හොරොව්පොතාන | 7124 | | |
| ගලෙන්බිඳුනුවැව | 7127 | | |
| මිහින්තලේ | 7130 | | |
| නැගෙනහිර නුවරගම්පළාත | 7133 | | |
| නාච්චදූව | 7136 | | |
| නොච්චියාගම | 7139 | | |
| රාජාංගනය | 7142 | | |
| තඹුත්තේගම | 7145 | | |
| තලාව | 7148 | | |
| තිරප්පනේ | 7151 | | |
| කැකිරාව | 7154 | | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය | අයත් පළාත හා අංකය |
|---|---|---|---|
| පළුගස්වැව | 7157 | 20 අනුරාධපුරය | 07 උතුරු මැද පළාත |
| ඉපලෝගම | 7160 | | |
| ගල්නෑව | 7163 | | |
| පලාගල | 7166 | | |
| | | | |
| හිඟුරක්ගොඩ | 7203 | 21 පොළොන්නරුව | |
| මැදිරිගිරිය | 7206 | | |
| ලංකාපුර | 7209 | | |
| වැලිකන්ද | 7210 | | |
| දිඹුලාගල | 7212 | | |
| තමන්කඩුව | 7215 | | |
| ඇලහැර | 7218 | | |
| | | | |
| මහියංගනය | 8103 | 22 බදුල්ල | 08 ඌව පළාත |
| රිදීමාලියද්ද | 8106 | | |
| මීගහකිවුල | 8109 | | |
| කන්දෙකැටිය | 8112 | | |
| සොරණාතොට | 8115 | | |
| පස්සර | 8118 | | |
| ලුණුගල | 8119 | | |
| බදුල්ල | 8121 | | |
| හාලිඇල | 8124 | | |
| ඌව පරණගම | 8127 | | |
| වැලිමඩ | 8130 | | |
| බණ්ඩාරවෙල | 8133 | | |
| ඇල්ල | 8136 | | |
| හපුතලේ | 8139 | | |
| හල්දුම්මුල්ල | 8142 | | |
| | | | |
| බිබිල | 8203 | 23 මොණරාගල | |
| මඩුල්ල | 8206 | | |
| මැදගම | 8209 | | |
| සියඹලාණ්ඩුව | 8212 | | |
| මොනරාගල | 8215 | | |
| බඩල්කුඹුර | 8218 | | |
| බුත්තල | 8221 | | |
| වැල්ලවාය | 8224 | | |
| කතරගම | 8227 | | |
| තණමල්විල | 8230 | | |
| සෙවණගල | 8233 | | |
| | | | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය | අයත් පළාත හා අංකය |
|---|---|---|---|
| ඇහැලියගොඩ | 9103 | 24 රත්නපුර | 09 සබරගමුව පළාත |
| කුරුවිට | 9106 | | |
| කිරිඇල්ල | 9109 | | |
| රත්නපුර | 9112 | | |
| ඉඹුල්පෙ | 9115 | | |
| බලංගොඩ | 9118 | | |
| කල්තොට | 9119 | | |
| ඕපනායක | 9121 | | |
| පැල්මඩුල්ල | 9124 | | |
| ඇලපාත | 9127 | | |
| අයගම | 9130 | | |
| කලවාන | 9133 | | |
| නිවිතිගල | 9136 | | |
| කහවත්ත | 9139 | | |
| ගොඩකවෙල | 9142 | | |
| වැලිගෙපොල | 9145 | | |
| ඇඹිලිපිටිය | 9148 | | |
| කොලොන්න | 9151 | | |
| | | | |
| රඹුක්කන | 9203 | 25 කෑගල්ල | |
| මාවනැල්ල | 9206 | | |
| අරණායක | 9209 | | |
| කෑගල්ල | 9212 | | |
| ගලිගමුව | 9215 | | |
| වරකාපොල | 9218 | | |
| රුවන්වැල්ල | 9221 | | |
| බුලත්කොහුපිටිය | 9224 | | |
| යටියන්තොට | 9227 | | |
| දෙහිඕවිට | 9230 | | |
| දැරණියගල | 9233 | | |

01 - 208

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.